එකතු කිරීම්	4,619,479.98	-	33,000.00	441,002.50	201,419.40	-	544,465.75	42,450.00	-	-	164,225.03	144,426.50	-	6,190,469.16
ඉවත් කිරීම් / මාරු කිරීම් (ස්ථාවර වත්කම්)	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
ඉවත් කිරීමේ / මාරු කිරීම් (සමුච්චිත ක්ෂය කර ඇති අගයන්)	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
වර්ෂය සඳහා ක්ෂය වීම්	(1,520,983.11)	(2,460,500.00)	(1,470,707.24)	(617,280.39)	(371,756.68)	(124,600.00)	(96,583.78)	(438,371.47)	-	(111,999.34)	(61,861.17)	(350,303.29)	(120,300.00)	(7,745,246.47)
ශුද්ධ ප්‍රත්‍යාගණනය	-		-	-	-	-	-	-	-	-	-	-	-	-
2019.12.31 දිනට ශුද්ධ අගය	**327,610,899.49**	**4,449,636.99**	**3,147,506.60**	**1,445,693.49**	**1,166,831.34**	**197,141.92**	**636,675.44**	**523,233.57**	**-**	**1,679,990.19**	**230,000.93**	**1,008,442.43**	**487,500.00**	**342,583,552.38**
ප්‍රත්‍යාගණන අතිරික්තයේ එකතුව	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
ප්‍රත්‍යාගණන ඌණතාවයේ එකතුව	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
දළ ධාරණ වටිනාකම	332,850,053.03	12,302,500.00	7,843,393.00	3,741,095.23	2,783,377.38	902,500.00	966,435.73	2,782,850.00	3,540.00	2,239,986.89	443,637.03	3,047,286.50	1,089,000.00	370,995,654.78
සමුච්චිත ක්ෂය වීම්	(5,239,153.54)	(7,852,863.01)	(4,695,886.40)	(2,295,401.74)	(1,616,546.04)	(705,358.08)	(329,760.29)	(2,259,616.43)	(3,540.00)	(559,996.70)	(213,636.10)	(2,038,844.07)	(601,500.00)	(28,412,102.40)
ශුද්ධ ධාරණ වටිනාකම	**327,610,899.49**	**4,449,636.99**	**3,147,506.60**	**1,445,693.49**	**1,166,831.34**	**197,141.92**	**636,675.44**	**523,233.57**	**-**	**1,679,990.19**	**230,000.93**	**1,008,442.43**	**487,500.00**	**342,583,552.38**

සටහන 02

වෙළඳ හා ලාභ අලාභ ගිණුම්

පැල අලෙවි සැල - නාරාහේන්පිට

2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම

අයිතම	2019	2018
වෙළඳ ආදායම	**8,976,860.50**	**11,708,988.55**
අඩකළා: විකුණුම් පිරිවැය		
ආරම්භක තොගය	976,511.34	1,037,884.55
මිලදී ගැනීම්	6,583,954.93	7,832,613.85
තොග හානි	-	-
අවසාන තොගය	(1,063,313.01)	(976,511.34)
	6,497,153.26	7,893,987.01
දළ ලාභය/අලාභය	**2,479,707.24**	**3,815,001.54**
පොදු කාර්ය පිරිවැය	1,681,726.41	1,503,137.04
ශුද්ධ ලාභය/අලාභය	**797,980.83**	**2,311,864.50**

දෙහිවල අලෙවිසැල

2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම

අයිතම	2019	2018
වෙළඳ ආදායම	**32,625,456.30**	**33,909,520.02**
අඩකළා: විකුණුම් පිරිවැය		
ආරම්භක තොගය	1,787,477.83	1,925,528.72
මිලදී ගැනීම්	28,031,829.23	29,059,394.70
තොග හානි	-	-
අවසාන තොගය	(1,860,236.12)	(1,787,477.83)
	27,959,070.94	29,197,445.59
දළ ලාභය/අලාභය	**4,666,385.36**	**4,712,074.43**
පොදු කාර්ය පිරිවැය	(4,888,791.16)	(5,779,637.17)
ශුද්ධ ලාභය/අලාභය	**(222,405.80)**	**(1,067,562.74)**

ආපනශාලාව - දෙහිවල

2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම

අයිතම	2019	2018
වෙළඳ ආදායම	**6,588,748.07**	**7,114,808.65**
අඩුකලා: විකුණුම් පිරිවැය		
ආරම්භක තොගය	23,101.78	48,541.36
මිලදී ගැනීම්	5,100,903.13	5,533,973.60
ප්‍රවාහන	-	-
අවසාන තොගය	(71,772.48)	(23,101.78)
	5,052,232.43	5,559,413.18
දළ ලාභය/අලාභය	**1,536,515.64**	**1,555,395.47**
පොදු කාර්ය පිරිවැය	(1,540,890.30)	(1,276,842.00)
ශුද්ධ ලාභය/අලාභය	**(4,374.66)**	**278,553.47**

පැල අලෙවි සැල - දෙහිවල

2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම

අයිතම	2019	2018
වෙළඳ ආදායම (පැළ සහ පෙහොර)	**6,302,736.00**	**6,288,143.00**
අඩුකලා: විකුණුම් පිරිවැය		
ආරම්භක තොගය	623,027.61	634,626.65
මිලදී ගැනීම්	4,351,415.88	4,574,456.25
තොග හානි	-	-
අවසාන තොගය	(579,784.89)	(623,027.61)
	4,394,658.60	4,586,055.29
දළ ලාභය/අලාභය	**1,908,077.40**	**1,702,087.71**
පොදු කාර්යපිරිවැය	(1,382,285.00)	(991,542.18)
ශුද්ධ ලාභය/අලාභය	**525,792.40**	**710,545.53**

සහල් පිටි ප්‍රවර්ධනයකිරීමේ ව්‍යාපෘතිය

2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම

අයිතම	2019	2018
ආරම්භක තොගය	-	-
මිලදී ගැනීම්	434,087.50	391,310.00
තොග හානි	-	-
අවසාන තොගය -අමුද්‍රව්‍ය	-	-
අමුද්‍රව්‍යපිරිවැය	434,087.50	391,310.00
ආරම්භක තොගය-නොනිමි වැඩ	-	-
තොග හානි	-	-
අවසාන තොගය-නොනිමි වැඩ	-	-
නිෂ්පාදන පිරිවැය	434,087.50	391,310.00
විකුණුම්ආදායම	**427,594.37**	**553,644.00**
අඩුකලා: විකුණුම් පිරිවැය		
ආරම්භක තොගය	64,006.66	71,167.84
නිෂ්පාදන වියදම	434,087.50	391,310.00
	498,094.16	462,477.84
තොග හානි	(72,894.44)	(32,396.21)
අවසාන තොගය	(34,243.42)	(31,610.45)
	390,956.30	398,471.18
දළ ලාභය/අලාභය	**36,638.07**	**155,172.82**
පොදු කාර්ය පිරිවැය	(502,798.00)	(450,160.10)
ශුද්ධ ලාභය/අලාභය	**(466,159.93)**	**(294,987.28)**

සුවපෝෂ ව්‍යාපෘතිය

2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම

අයිතම	2019	2018
ආරම්භකතොගය	30,000.00	90,250.00
මිලදී ගැනීම්	-	22,300.00
තොග හානි	-	-
අවසාන ඇසුරුම් තොගය-අමු ද්‍රව්‍ය	-	(30,000.00)
අමු ද්‍රව්‍ය පිරිවැය	30,000.00	82,550.00
ආරම්භක තොගය- නොනිමි වැඩ	-	-
අවසාන තොගය - නොනිමි වැඩ	-	-
නිෂ්පාදන වියදම	30,000.00	82,550.00
විකුණුම් ආදායම	**0**	**80,205.00**
අඩුකලා: විකුණුම් පිරිවැය		
ආරම්භක තොගය	606.45	31,535.40
නිෂ්පාදනවියදම	30,000.00	82,550.00
	30,606.45	114,085.40
තොග හානි	-	(186.60)
අවසාන තොගය	-	(419.85)
	30,606.45	113,478.95
දළ ලාභය/ අලාභය	**(30,606.45)**	**(33,273.95)**
පොදු කාර්ය පිරිවැය	(464,730.00)	(442,933.10)
ශුද්ධ ලාභය/අලාභය	**(495,336.45)**	**(476,207.05)**

මව්පෝෂ ව්‍යාපෘතිය

2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම

අයිතම	2019	2018
ආරම්භක තොගය	9,115.00	842,150.00
මිලදී ගැනීම්	-	180,105.00
සෘජු වැටුප්	-	-
ප්‍රවාහන	-	-
තොග හානි	-	-
අවසාන ඇසුරුම් තොගය- අමු ද්‍රව්‍ය	-	(7,700.00)
	9,115.00	1,016,840.00
ආරම්භක තොගය-නොනිමි වැඩ	-	-
අවසාන තොගය-නොනිමි වැඩ	-	-
නිෂ්පාදන පිරිවැය	9,115.00	1,016,840.00
වෙළඳ ආදායම	-	**1,076,108.00**
අඩුකලා: විකුණුම් පිරිවැය		
ආරම්භක තොගය	3,777.58	56,266.06
නිෂ්පාදන වියදම	9,115.00	1,016,840.00
	12,892.58	1,073,106.06
තොග හානි	-	(2,982.30)
අවසාන තොගය	-	(795.28)
	12,892.58	1,069,328.48
දළ ලාභය/ අලාභය	**(12,892.58)**	**6,779.52**
පොදු කාර්යපිරිවැය	(472,480.00)	(905,502.70)
ශුද්ධලාභය/අලාභය	**(485,372.58)**	**(898,723.18)**

කොම්පොස්ට් ව්‍යාපෘතිය - බුත්තල

2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම

අයිතම	2019	2018
ආරම්භක තොගය	489,215.50	356,342.20
මිලදී ගැනීම්	2,542,382.50	2,125,170.80
සෘජු වැටුප්	-	-
ප්‍රවාහන	-	-
අවසාන තොගය- අමු ද්‍රව්‍ය	(559,436.15)	(489,215.50)
	2,472,161.85	1,992,297.50
ආරම්භක තොගය-නොනිම්වැඩ	-	-
අවසාන තොගය-නොනිම් වැඩ	-	-
නිෂ්පාදන වියදම	2,472,161.85	1,992,297.50
වෙළඳ ආදායම්	**2,940,050.00**	**2,571,350.00**
අඩුකලා: විකුණුම් පිරිවැය		
ආරම්භක තොගය	-	-
නිෂ්පාදන වියදම	2,472,161.85	1,992,297.50
අවසාන තොගය	-	-
	2,472,161.85	**1,992,297.50**
දළ ලාභය/ අලාභය	**467,888.15**	**579,052.50**
පොදු කාර්ය පිරිවැය	(375,675.20)	(402,128.80)
ශුද්ධලාභය/අලාභය	**92,212.95**	**176,923.70**

පාරම්පරික සහල්ව්‍යාපෘතිය

2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම

අයිතම	2019	2018
ආරම්භක තොගය	163,966.93	-
මිලදී ගැනීම්	4,286,448.50	465,537.80
ප්‍රවාහන	-	-
ඇඹරුම් පිරිවැය	-	-
සෘජු වැටුප්	-	-
තොග හානි	-	(13,750.00)
අවසාන තොගය	(2,440,095.62)	(150,216.87)
	2,010,319.81	301,570.87
ආරම්භක තොගය-නොනිමි වැඩ	-	-
තොග හානි	-	-
අවසාන තොගය-නොනිමි වැඩ	-	-
නිෂ්පාදන වියදම	2,010,319.81	301,570.87
වෙළඳ ආදායම	**2,426,497.90**	**636,149.00**
අඩුකලා:විකුණුම් පිරිවැය		
ආරම්භක තොගය	7,7780.00	-
නිෂ්පාදන වියදම	2,010,319.81	301,570.87
	2,018,099.81	301,570.87
තොග හානි	-	(2,380.00)
අවසාන තොගය	(357,202.30)	(5,400.00)
	1,660,897.51	293,790.87
දළ ලාභය/අලාභය	**765,600.39**	**342,358.13**
පොදු කාර්යපිරිවැය	(716,112.80)	(1,212,327.26)
ශුද්ධ ලාභය/අලාභය	**49,487.59**	**(869,969.13)**

බුත්තල ගොවිපල

2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම

අයිතම	2019	2018
ආරම්භක තොගය	-	-
මිලදී ගැනීම්	5,050.00	
අවසාන තොගය- අමු ද්‍රව්‍ය	-	-
	-	-
වෙළඳ ආදායම	17,422.00	35,340.00
අඩුකලා:විකුණුම් පිරිවැය		
දළ ලාභය/අලාභය	12,372.00	35,340.00
පොදු කාර්ය පිරිවැය	519,909.92	664,389.50
ශුද්ධලාභය/අලාභය	(507,537.92)	(629,049.50)

තණමල්විල ගොවිපල

2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම

අයිතම	2019	2018
ගොවිපල ආදායම	50,000.00	116,000.00
අඩුකලා: විකුණුම් පිරිවැය		
ආරම්භක තොග		
නිෂ්පාදන වියදම	-	-
අවසාන තොග	-	-
දළ ලාභය/අලාභය	50,000.00	116,000.00
පොදු කාර්ය පිරිවැය	(478,959.96)	(475,686.60)
ශුද්ධලාභය/අලාභය	(428,959.96)	(359,686.60)

සෝයා ව්‍යාපෘතිය

2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම

අයිතම	2019	2018
වෙළඳ ආදායම	**137,925.00**	**8,444,880.00**
අඩුකලා: විකුණුම් පිරිවැය		
ආරම්භක තොග	174,705.00	10,130,705.00
තොග සැකසුම් ගාස්තු	-	406,497.50
අවසාන තොග	-	(174,705.00)
	174,705.00	**10,362,497.50**
දළ ලාභය/අලාභය	**(36,780.00)**	**(1,917,617.50)**
පොදු කාර්ය පිරිවැය	-	610,069.66
ශුද්ධලාභය/අලාභය	**(36,780.00)**	**(2,527,687.16)**

BFN ව්‍යාපෘතිය

2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම

අයිතම	2019	2018
වෙළඳ ආදායම	**147,534.00**	**361,967.00**
අඩුකලා:විකුණුම් පිරිවැය		
ආරම්භක තොග	560.00	420.00
මිලදී ගැනීම්	150,529.00	173,265.48
ඇසුරුම් කිරීම	12,183.74	12,183.74
තොග හානි	-	-
අවසාන තොග	(16,560.00)	(560.00)
	134,529.00	**185,309.22**
දළ ලාභය/අලාභය	**13,005.00**	**176,657.78**
පොදු කාර්ය පිරිවැය	603,265.72	526,132.10
ශුද්ධලාභය/අලාභය	**(590,260.72)**	**(349,474.32)**

බඩඉරිඟු (ආනයනය) ව්‍යාපෘතිය

2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ ගිණුම

අයිතම	2019	2018
වෙළඳ ආදායම	**2,613,731,100.95**	**1,929,827,773.90**
අඩුකලා: විකුණුම් පිරිවැය		
ආරම්භක තොග		
මිලදී ගැනීම්	2,561,772,094.81	1,887,997,331.20
ප්‍රවාහන		
ඇසුරුම් කිරීම		
තොග හානි		
අවසාන තොග		
	2,561,772,094.81	**1,887,997,331.20**
දළ ලාභය/අලාභය	**51,959,006.14**	**41,830,442.70**
පොදු කාර්ය පිරිවැය	380,059.71	754,871.35
ශුද්ධලාභය/අලාභය	**51,578,946.43**	**41,075,571.35**

වෙළඳ ලාභ /අලාභගිණුම්

ව්‍යාපෘතිය	2019		2018	
	දළ ලාභය/ (අලාභය)	දළ ලාභය/ (අලාභය)	දළ ලාභය/ (අලාභය)	ශුද්ධ ලාභය/ (අලාභය)
දෙහිවල අලෙවිසැල	4,666,385.36	(222,405.80)	4,712,074.43	(1067562.74)
ආපන ශාලාව - දෙහිවල	1,536,515.64	(4,374.66)	1,555,395.47	278553.47
පැල අලෙවි සැල - නාරාහේන්පිට	2,479,707.24	797,980.83	3,815,001.54	2311864.50
පැල අලෙවි සැල - දෙහිවල	1,908,007.40	525,792.40	1,702,087.71	710545.53
සහල් පිටි ව්‍යාපෘතිය - කලංකුට්ටිය	36,638.07	(466,159.93)	155,172.82	(294987.28)
සුවපෝෂ ව්‍යාපෘතිය	(30,606.45)	(495,336.45)	(33,273.95)	(476207.05)
මව්පෝෂ ව්‍යාපෘතිය	(12,892.58)	(485,372.58)	6,779.52	(898723.18)
බුත්තල කොම්පොස්ට්	467,888.15	92,212.95	579,052.50	176923.70
පාරම්පරික සහල් ව්‍යාපෘතිය	765,600.39	49,487.59	342,358.13	(869969.13)
බුත්තල ගොවිපල	12,372.00	(507,537.92)	35,340.00	(629049.50)
තණමල්විල ගොවිපල	50,000.00	(428,959.96)	116,000.00	(359686.60)
සෝයා ව්‍යාපෘතිය	(36,780.00)	(36,780.00)	(1,917,617.50)	(2527687.16)
දේශීය බඩඉරිඟු මිලදී ගැනීමේ ව්‍යාපෘතිය	-	-	113,877.02	(224399.48)
පළතුරු බීම BFN ව්‍යාපෘතිය	13,005.00	(590,260.72)	176,657.78	(349474.32)
බඩඉරිඟු (ආනයන) ව්‍යාපෘතිය	51,959,006.14	51,578,946.43	41,830,442.70	41075571.35
එකතුව	**63,814,916.36**	**49,807,232.18**	**53,189,348.17**	**36855712.11**

03. සෘජු සංවර්ධන වියදම් ආධාර මුදල් යටතේ දක්වා ඇත.

04. ප්‍රධාන කාර්යාලයේ පරිපාලනය සඳහා දැරූ සියලු වියදම් භාණ්ඩාගාර අරමුදල් යටතේ දරා ඇත.

05. භාණ්ඩාගාර අරමුදල්

විස්තරය	අයවැය ප්‍රතිපාදන	2019 සත්‍ය වියදම්	2019 වර්ෂයේ භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන	ඉතිරිය / ඌනතාවය
පුනරාවර්ථන	78,058,700.00	47,719,012.93	47,629,934.00	30,428,766.00
ප්‍රාග්ධන	8,000,000.00	4,834,656.47	4,834,656.47	3,165,343.53
			52,464,590.47	

06. කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් හා ලෝක ආහාර වැඩසටහනින් ලද අරමුදල් පහත සඳහන් පරිදි පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් ලෙස භාවිතා කරන ලදී.

විස්තරය	ප්‍රාග්ධන	පුනරාවර්තන	එකතුව
සහල් සබලකරණ ව්‍යාපෘතිය	278,080.00	25,529,739.66	25,807,819.66
කාබනික පොහොර ව්‍යාපෘතිය	38,584.00	1,132,673.06	1,171,257.06
වප් මගුල	-	20,570.00	20,570.00
එකතුව			26,999,646.72

භාණ්ඩාගාර හා අමාත්‍යාංශ ප්‍රතිපාදන (පුනරාවර්තන සහ ප්‍රග්ධන)	රු. 79,464,237.19
ප්‍රාග්ධන	රු. 5,151,320.47
පුනරාවර්තන	රු. 74,312,916.72

07. අම්බලන්තොට ගොවිපලේ ඉදි කරන ලද වැට සඳහා ගෙවීමට නියමිත රු.3,209,728.53 ක මුදල සඳහා කොළඹ දිස්ත්‍රික් උසාවියේ නඩු අංක DMR 02401-13 යටතේ මේ වන විටත් විභාග වෙමින් පවතියි.

08. කුඩා වැව් සංවර්ධන ව්‍යාපෘතියෙන් ලද 81,134,631.80 මුදලින් පහත ආකාරයට 2017 සහ 2018 වර්ෂයන්හි, වැය පහත දැක්වෙන ආකාරයට තැන්පතු වලින් අඩු කොට දක්වා ඇත.

ආපසුගෙවියයුතුතැන්පතු	රු. 81,269,260.00
2017 වර්ෂයේ වැය වූ වියදම්	රු. (1,445,668.16)
2018 වර්ෂයේ වැය වූ වියදම්	රු. (1,924,927.39)
එකතුව	**රු. 77,898,664.45**

09. දෙහිවල පැළ අලෙවි සැල, දෙහිවල අලෙවිසැල හා දෙහිවල ආපනශාලාවේ ගිණුම් වෙන වෙනම පෙන්වා ඇත.

10. දේශීය සෝයා ව්‍යාපෘතිය යටතේ මිලදී ගනු ලැබූ, යම් ප්‍රමානයක් අස්ථානගත වීම සම්බන්ධයෙන්, කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ මූලික පරීක්ෂණයක් පැවැත්වෙමින් පවතී.

2019 විගණන වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. ජේජේඑල්/ඩී/එච්සිබී/01/19/19
මබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2020 ජූලි 13 දින

FFHC BOARD
16 JUL 2020
2351
No. 45, Kirimandala Mw., Narahenpita.

සභාපති,
ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය.

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත: 01. ලේකම්, මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය.
02. ලේකම්, මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය

අංක 306/72, පොළduwa පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } ඒජීඑල්/ඩී/එච්සිබී/01/19/19 ඔබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2020 ජූලි 13 දින

සභාපති,

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීම් ප්‍රකාශනය, සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 ට අනුව ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේදවල වැරදි ඒවා සොයා ගැනීමෙන් පසුව නිකුත් කිරීම සඳහා අනුමත කරන මූල්‍ය ප්‍රකාශනවල අතීතානුයෝගීව ගලපා සංසන්ධනාත්මක අගයන් ප්‍රතිඉස්යාපනය කර, එම වැරදිවල ස්වභාවය හා ගලපන ලද ආකාරය පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කළ යුතු වුවද ඉකුත් වර්ෂයට අදාළව සමාලෝචිත වර්ෂයේදී සිදු කර තිබුණු රු. 8,012,320 ක වැරදි නිවැරදි කිරීම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. එසේම ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වැරදි නිවැරදි කිරීම් කර නැවත ප්‍රතිඉස්යාපනය කර තිබුණද ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ආ) මණ්ඩලය විසින් භාණ්ඩාගාර ප්‍රදාන මගින් මිලට ගත් වත්කම් සඳහා 2015 සිට 2018 කාලපරිච්ඡේද ඇතුළත්ව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින සිට ක්‍රමක්ෂය ගැලපීම් කර තිබුණි. එසේ වුවත් එහිදී 2015 සිට 2018 දක්වා කාලයට අදාළව සිදුකර තිබුණු ක්‍රමක්ෂය ගැලපීම් රු. 5,043,761 ක් අඩුවෙන්ද, 2019 වර්ෂයට අදාළ ක්‍රමක්ෂය රු. 798,157 ක් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) 2004 සිට 2019 දක්වා නාරහේන්පිට පිහිටි ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල සඳහා කොළඹ මහ නගර සභාවට ගෙවිය යුතු වූ වරිපනම් බදු රු. 2,384,989 වගකීම් ගිණුම් වල ගලපා මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඈ) ස්ථාවර තැන්පතුවක් සඳහා 2018 වර්ෂයට අදාළව ලැබී තිබුණු රු. 331,907 ක පොලී ආදායම් සමාලෝචිත වර්ෂයේ ආයෝජන ආදායමක් ලෙස දක්වා තිබුණු අතර සමාලෝචිත වර්ෂයට අදාළ ලැබිය යුතු ආයෝජන ආදායම් රු. 774,855 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බැවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මහහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම්, චේතනාන්විත මහහැරීම් හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීම් වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම්වල යෝග්‍යතාවය ඇගයීම්.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබා ගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම්.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

4

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප බව.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම් තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලයට සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධිවිධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියාකර ඇති බව

5

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

නීතිරීති / විධානයට යොමුව	විස්තරය
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ 104	සමාලෝචිත වර්ෂයේදී නාරහේන්පිට ප්‍රධාන කාර්යාලයේ සිදු වූ රු. 48,990 ක් වටිනාකමැති ජංගම දුරකථනයක් අස්ථානගත වීම, 2012 වර්ෂයේදී නාරහේන්පිට පැළ තවානේ සිදු වූ රු. 77,362 ක මුදල් වංචා සහ 2018 වර්ෂයේ අනුරාධපුර උපුල්දෙණිය ගබඩාවේ සිදු වූ රු. 4,094,596 ක වටිනාකමැති සෝයා බෝංචිකිලෝ ග්‍රෑම් 37,223 ක් අස්ථානගත වීම සම්බන්ධ පරීක්ෂණ සිදු කර නොතිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 13.1.2 වගන්තිය	වැඩබැලීමේ පත්වීමක් සඳහා බඳවා ගැනීමේ පරිපාටිය අනුව අදාළ තනතුරට සෑම අතින්ම සුදුසුකම් ඇති නිලධාරියෙකු පත්කළ යුතු වුවද සුදුසුකම් නොමැති ව්‍යාපෘති සහකාර III ශ්‍රේණියේ නිලධාරියෙකුට 2011 මැයි 02 දින වැඩබලන සහකාර අධ්‍යක්ෂ ලෙස පත්කර ඒ වෙනුවෙන් මාස 15 ක් සඳහා රු. 96,150 ක වැඩ බැලීමේ දීමනාවක් ගෙවා තිබුණි.
(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය i. 5.4.10 (ඇ) වගන්තිය	ගිවිසගත් සැපයුම් වටිනාකමින් සියයට 10 කට නොඅඩු කාර්යසාධන සුරක්ෂණයක් භාණ්ඩ සැපයුම්කරුවෙකුගෙන් ලබාගත යුතු වුවත් රු. මිලියන 1,506 ක් වටිනා බඩඉරිඟු ආනයනය කළ පුද්ගලික සමාගමකින් ලබාගත යුතුව තිබුණු රු. මිලියන 150.6 කට නොඅඩු සුරක්ෂණය වෙනුවට රු. මිලියන 5 ක සුරක්ෂණයක් පමණක් ලබාගෙන තිබුණි. එම කාර්යය සඳහාම රු. මිලියන 618.7 ක වටිනාකමකට සහ රු. මිලියන 500.6 ක වටිනාකමකට ගිවිසුම් අත්සන් කර තිබුණු තවත් පුද්ගලික සමාගම් 2 කින් කිසිදු සුරක්ෂණයක් ලබා නොගෙන කොන්ත්‍රාත් පවරා තිබුණි. එසේ වුවත් එම සැපයුම්කරුවන්ට ගෙවීම් කිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව රු. මිලියන 5 බැගින් කාර්යසාධන සුරක්ෂණයන් අඩුකර තිබුණි.
ii. 2.14.1 සංශෝධිත වගන්තිය	රු. මිලියන 2,690 වටිනාකම් වූ බඩ ඉරිඟු ආනයනය කිරීමේ ප්‍රසම්පාදන කටයුත්ත සඳහා අමාත්‍ය මණ්ඩලය පත්කළ ප්‍රසම්පාදන කමිටුව අනුමැතිය ලබාගත යුතු වුවත්, මණ්ඩලය විසින් පත්කළ ප්‍රසම්පාදන කමිටුව විසින් එය අනුමත කර තිබුණි. එහිදී කමිටු සාමාජිකයන් තිදෙනා අතරින් එක් අයෙකු ප්‍රසම්පාදන තීරණයට අත්සන් තබාද නොතිබුණි.

6

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර මණ්ඩලයේ කර්තව්‍ය හා කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව

  2017 සහ 2018 වර්ෂවලදී 1973 අංක 15 දරන ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩල පනතේ දක්වා ඇති අරමුණක් නොවූ වැව්වල පස් ඉවත් කර අධිවේගී මාර්ගවලට විකිණීමේ කටයුතු සිදු කර තිබුණි. පස් ඉවත් කිරීම වෙනුවෙන් රු. 3,370,595 ක වියදමක් දරා තිබුණු අතර අධිවේගී මාර්ගවලට පස් විකිණීමෙන් රු. 81,134,631 ක ආදායමක් ලබා තිබුණි. වැව් ව්‍යාපෘති වාර්තාවට අනුවසපයන ලද පස් සඳහා අදාළ ගොවි සංවිධානවලින් මණ්ඩලයට මුදල් ලබාගෙන එම මුදල් රජයේ ප්‍රතිපාදනද සමග යොදා කුඩා වැව් නිසි ප්‍රමිතියට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු උපදේශකත්වය යටතේ සංවර්ධනය කළ යුතු බව දක්වා තිබුණත් එසේ නොකර රු. 77,764,036 ක් ස්ථාවර තැන්පත් ගිණුමක රඳවාගෙන තිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

3. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) 2019 වර්ෂයේ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම මගින් ව්‍යාපෘති 11 ක් සඳහා රු. මිලියන 145 ක් වෙන්කර තිබුණු අතර ඉන් සියයට 45 ක් උපයෝජනය කර තිබුණි. මෙම ව්‍යාපෘති 11 න්, මේ දක්වා මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරගෙන ආ ව්‍යාපෘති 03 ක් එනම් පර්යේෂණ සිදුකර නවෝත්පාදන ලෙස හඳුනාගත් සෝයා ආශ්‍රිත නිෂ්පාදන ව්‍යාපෘතිය, ඌණ භාවිත පලතුරු බීම නිෂ්පාදන ව්‍යාපෘතිය සහ මණ්ඩලයේ සුවිශේෂී නිෂ්පාදනයන් වූ සුවපෝෂ හා මව්පෝෂ නිෂ්පාදනය හා තෝසේ පිටි නිෂ්පාදන කටයුතු මණ්ඩලය විසින් වෙළඳපොළ අවස්ථා උකහාගෙන නිෂ්පාදන ධාරිතාව හා සම්පත් යොදාගනිමින් නිෂ්පාදනය සිදුකර ලාභ උපයාගැනීමට කටයුතු සිදු නොකර පෞද්ගලික ව්‍යාපාරික සමාගම් සමඟ ගිවිසුම්ගතව නිෂ්පාදනය, බොදාහැරීම හා ප්‍රවර්ධන කටයුතු කිරීමට තීරණය කර තිබුණි. ක්‍රියාකාරී සැලැස්ම මගින්තණමල්විල ගොවිපලෙහිවියළි ගොම හා කොහුබත් මෙට්‍රික් ටොන් 75 බැගින් සැකසීම සඳහා රු. මිලියන 3.95 ක් වෙන් කර තිබුණත් එම නිෂ්පාදනයන් සිදුකර නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම අනුව බුත්තල ගොවිපලෙහි කොම්පෝස්ට් පොහොර හා බඳුන් මිශ්‍රණ කිලෝ ග්‍රෑම් 300,000 බැගින් සැකසීමට සැලසුම් කර තිබුණත් කොම්පෝස්ට් පොහොර කිලෝ ග්‍රෑම් 129,115 ක් (සියයට 43) හා බඳුන් මිශ්‍රණ කිලෝ ග්‍රෑම් 119,000 ක් (සියයට 40) පමණක් නිෂ්පාදනය කර තිබුණි. පොහොර ව්‍යාපෘතියේ ශුද්ධ ලාභය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 48 කින් අඩු වී තිබුණි.

(ඇ) ඌණ භාවිත පලතුරු බීම නිෂ්පාදන ව්‍යාපෘතියේ 2019 වර්ෂය සඳහා පලතුරු බීම බෝතල් 25,000 ක් නිෂ්පාදනයට සැලසුම් කර තිබුණද, ඉන් සියයට 12 ක පමණක් නිෂ්පාදනය කර තිබුණු අතර සෝයා ආශ්‍රිත ආහාර නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා පසුගිය ආසන්නතම වර්ෂ 03 ක් ඇතුළත රු. මිලියන 2.8 ක් වැයකර තිබුණද අවසන් නිෂ්පාදනය පාරිභෝගිකයා වෙත මණ්ඩලය විසින් ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) බඩඉරිහු ආනයනය කිරීමේදී එහි ප්‍රමිතිය මණ්ඩලය විසින් පරීක්ෂා කර අනුමත කිරීමට කටයුතු නොකිරීම නිසා එක් බඩඉරිහු ආනයනකරුවෙකු විසින් නියමිත පිරිවිතරවලට අනුකූල නොවන මෙට්‍රික් ටොන් 13,000 ක ප්‍රමාණයක් ආනයනය කර සත්ත්ව ආහාර නිෂ්පාදකයින් හට බෙදා හැර තිබුණි. එසේම මේ මඟින් සත්ව ආහාරවලට වන බලපෑම පිළිබඳ ඇගයීමක්ද සිදුකර නොතිබුණි.

(ඉ) මණ්ඩලය ලබාදුන් තොරතුරුවලට අනුව දේශීය නිෂ්පාදනය ප්‍රමාණවත් නොවීම නිසා සමාලෝචිත වර්ෂයේදී විදේශවලින් ආනයනය කර තිබුණු බඩඉරිහු ප්‍රමාණය මෙට්‍රික් ටොන් 49,554 ක් බව දක්වා තිබුණද මෙකී ආනයනයන් සම්බන්ධව රේගුවෙන් ලබාගත් තොරතුරුවලට අනුව ආනයනය කර තිබුණු තථ්‍ය බඩඉරිහු මෙට්‍රික් ටොන් ප්‍රමාණය 37,186 ක් විය. මේ අනුව වෙනස වූ මෙට්‍රික් ටොන් 12,368 ක ප්‍රමාණය දේශීය ගොවීන්ගෙන් අඩු මිලට ලබාගෙන ගබඩාකර තබාගත් තොගවලින් ප්‍රතිපූර්ණය කර තිබුණු බව නිරීක්ෂණය වන අතර මෙමඟින් බඩඉරිහු ආනයනය කළ ආයතන තොග සහවා තබා ගැනීම තුලින් අවම මිල ගණන් යටතේ වුවද රු.මිලියන 55 ක පමණ අයුතු ලාභයක් උපයා ඇති බවට වන සැකය විගණනයේදී බැහැර කළ නොහැකි විය. එසේ වුවත්, මෙම කටයුතුවලට මැදිහත් වීමට මණ්ඩලයට අමාත්‍ය මණ්ඩලය විසින් බලය පවරාතිබුණද, මණ්ඩලය මේ පිළිබඳ සොයා බලා අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී වික්‍රමරත්න
විගණකාධිපති

8